2014

# අතුරුදහන් වූවන් පිළිබඳව පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව

# ප්‍රවණතා, භාවිතයන් සහ බලපෑම්

විවේචනාත්මක විග්‍රහයක්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

විවේචනාත්මක විග්‍රහයක්

# අතුරුදහන් වූවන් පිළිබඳව පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව: ප්‍රවණතා, භාවිතයන් සහ බලපෑම්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2014 දෙසැම්බර්

CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන, දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් පාලනය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


ලිපිනය : 24/2, 28 වන පටුමග, පිටත මල් පාර, කොළඹ 7, ශ්‍රී ලංකාව
දුරකතන : +94 (11) 2565304/5/6
ෆැක්ස් : +94 (11) 4714460
වෙබ් අඩවිය : www.cpalanka.org
විද්‍යුත් තැපැල : info@cpalanka.org

අතුරුදහන් වූවන් පිළිබඳව පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව (කොමිෂන් සභාව) 2013 අගෝස්තු 15 අංක 1823/42 දරණ ගැසට් නිවේදනය මගින් පිහිටුවන ලදී. නිල පැවරුම ලැබී වසරකට අධික කාලයක් ගත වී ඇති මේ අවස්ථාව වන විට කොමිෂන් සභාව ක්‍රියා කරමින් සිටින්නේ ශ්‍රී ලංකාවේ සත්‍ය සෙවීම" යුක්තිය සහ වගවීම සම්බන්ධයෙන් බැරෑරුම් ගැටලු මතු කරන තත්ත්වයක් යටතේ ය. ශ්‍රී ලංකා රජය විසින් කොමිෂන් සභාව විස්තර කරනුයේ අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයගේ දුක්ගැනවිලිවලට පිළියම් ලබා දෙන මූලික මෙවලම ලෙස පමණක් නොවේ. කොමිෂන් සභාවේ නිල පැවරුම පුළුල් කළ තැන සිට, වෙනත් කරුණු අතර, යුද සමයේ දී සිදු වූ ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානවවාදී නීති (humanitarian law) උල්ලංඝනයන් සම්බන්ධයෙන් පිළියම් ලබා දෙන එක ම යාන්ත්‍රණය ලෙස ද රජය විසින් මෙම කොමිෂන් සභාව හඳුන්වා දෙනු ලැබේ.

කොමිෂන් සභාව විසින් පවත්වන ලද මහජන හමුවල දී නිරීක්ෂණය කරන ලද ප්‍රධාන ගැටලු සහ ප්‍රවණතා මෙන්ම, දැනට ක්‍රියාත්මක වන ක්‍රියාවලිය නිරීක්ෂණය කර ඇති සහ ඊට සම්බන්ධව සිටින බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ සහ සිවිල් සමාජයේ වැටහීම් ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉදිරිපත් කරන මෙම විවේචනාත්මක විග්‍රහය තුළ කැටිකොට තිබේ. විමර්ශනය කිරීමේ කොමිෂන් සභා (Commissions of Inquiry) නමැති සංකීර්ණ ව්‍යුහය යටතේ පවත්වාගෙන යනු ලබන මෙම කොමිෂන් සභාව ව්‍යුහාත්මක වශයෙන් දෝෂ සහිත බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ආරම්භයේ දී ම අවධානයට ලක් කරනු ලැබේ. මන්ද, එම කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම, මූල්‍ය සහය ලබා ගැනීම සහ අනුගමනීය ක්‍රියාකාරකම් සඳහා විධායකය මත යැපීමට ඊට සිදු වී ඇති නිසා ය. සංක්‍රමනීය යුක්තිය (transitional justice) ඉටු කිරීමට රජය විසින් මෑත කාලීනව සිදු කළ මුලපිරීම් රැසක් අසාර්ථක වීම සහ කලින් කළ බලයට පැමිණි රජයයන් මගින් පත් කළ කොමිෂන් සභාවල ප්‍රගතියක් නොතිබීමත් නිරීක්ෂණය කළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉල්ලා සිටින්නේ සත්‍ය සොයා යාම, යුක්තිය සහ වගවීමේ අවංක සහ විශ්වාසනීය අභ්‍යන්තර ක්‍රියාවලියක් සපයන නෛතික සහ ප්‍රතිපත්තිමය සංශෝධන සඳහා වහාම පියවර ගන්නා ලෙසයි. මේ සම්බන්ධයෙන් පියවර ගැනීමට අපොහොසත් වීම, පශ්චාත් යුද සන්දර්භයක් තුළ අභ්‍යන්තර ක්‍රියාවලීන් මගින් දුක්ගැනවිලිවලට පිළියම් ලබා දීමට ඇති නොහැකියාව තව දුරටත් තහවුරු කරන අතර, ජාත්‍යන්තර විමර්ශනවලට ඇරයුම් කිරීම තවත් සවිමත් වේ.

මෙම සාරාංශය කොටස් තුනකින් සමන්විත වේ. පළමු කොටස මගින් වත්මන් කොමිෂන් සභාවේ **තාක්ෂණික ගැටලු** පිළිබඳව සාකච්ඡා කරමින් කොමිෂන් සභාවේ මෙහෙයුම් ක්‍රියාවලිය සහ ව්‍යවහාරයන් විවේචනාත්මකව විග්‍රහ කෙරේ. කොමිෂන් සභාව මෙහෙයවනු ලබන ව්‍යුහයට කා වැදී ඇති **පුළුල් ගැටලු** දෙවන කොටස මගින් සොයා බැලේ. තුන්වන කොටස මගින් විග්‍රහ කෙරෙනුයේ **ප්‍රවණතා, ප්‍රත්‍යක්ෂ වූ කරුණු සහ සැළකිල්ලට භාජනය විය යුතු කරුණු** සහ කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වයට ඒවායින් ඇති වන බලපෑම් ය.

**තාක්ෂණික ගැටලු**

ආරම්භයේ දී ම අවධානයට ලක් කළ යුතු වැදගත් ප්‍රධාන ගැටලුවක් නම්, **කොමිෂන් සභාවේ මහජන හමුවීම් සහ ඒවා රැස්වීමේ අරමුණ පිළිබඳව ප්‍රමාණවත් දැනුවත්බවක් නොමැති වීමයි**. කොමිෂන් සභාව එකම දිස්ත්‍රික්කයක් තුළ දෙවන වටයේ මහජන හමුවීම් පවත්වන විට ද අලුතෙන් පැමිණිලි රැසක් ලියාපදිංචි කරනු ලැබීමෙන් මේ බව පැහැදිලි වේ.[1] පැමිණිලි භාර දෙන ලෙසට මුල් වාරයේ සිදු කළ දැනුම් දීම, පැමිණිලි කිරීමේ ක්‍රියාවලිය සහ කොමිෂන් සභාවේ මහජන හමුවීම් පිළිබඳ දැනුවත් කිරීම් ආදිය බලපෑමට ලක්ව සිටින පුද්ගලයන් රැසකට දැන ගැනීමට ලැබී නොමැති

[1] මේ වන විට කොමිෂන් සභාව විසින් මඩකලපුව, කිලිනොච්චි සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල දෙවන වටයේ මහජන හමුවීම් පවත්වා තිබේ. කොමිෂන් සභාවේ ම වෙබ් අඩවියෙහි සඳහන් වාර්තාවලට අනුව, එම දිස්ත්‍රික්කවල අලුතෙන් පැමිණිලි පිළිවෙලින් 213, 106 සහ 166ක් ලැබී ඇත. තව ද, මුලතිව් දිස්ත්‍රික්කයේ මැරිටයිම්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට කොමිෂන් සභාව මීට පෙර ගොස් තිබුණ ද, එම ප්‍රදේශයෙන් නව පැමිණිලි ලැබී ඇති බව කොමිෂන් වාර්තාවල සඳහන් වේ. එම වාර දෙකේ දී ම නව පැමිණිලි සටහන් කරගෙන තිබේ.

බව මින් පැහැදිලි වේ. ඒ අනුව, කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව නොදැනුවත්කම නිසා, කොමිෂන් සභාව විසින් පැමිණිලි භාර ගත් අවස්ථාව සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල එක් එක් දිස්ත්‍රික්ක තුළ කොමිෂන් සභාවේ මහජන හමුවීම් පැවැත්වුණු අවස්ථාව යන, පැමිණිලි ලියාපදිංචි කිරීමට තිබුණු අවස්ථා දෙකම මග හැරී ගිය පුද්ගලයන් සඳහා ඇති විසඳුම කුමක්ද යන ගැටලුව ඉතිරිව ඇත.

මෙම ගැටලුව සංකීර්ණ වී ඇත්තේ **කොමිෂන් සභාව සහ එහි නිල පැවරුම පිළිබඳව ප්‍රමාණවත් දැනුවත්කමක් නොමැති වීම** නිසා ය. එකම දිස්ත්‍රික්කයක කොමිෂන් සභාවේ මහජන හමුවීම් දෙවරක් පවත්වන අවස්ථාවල දී, මුල් හමුව සඳහා පැමිණ කරුණු ඉදිරිපත් කළ සමහර පුද්ගලයන්, දෙවන වරටත් පැමිණ ඇත්තේ එම කොමිෂන් සභාව ම බව නොදැන, නැවතත් කරුණු ඉදිරිපත් කිරීම සඳහා පැමිණි අවස්ථා පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට දැන ගැනීමට ඇත. සමහර අවස්ථාවල, එකම වටයක් තුළ දී ම සමහර පුද්ගලයන් කොමිෂන් සභාව එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක දී මහජන හමුවක් පවත්වන විට ඊට සහභාගි වී කරුණු ඉදිරිපත් කර, ඉන් දිනකට හෝ දෙකකට පසුව තවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක දී පැවැත්වෙන මහජන හමුවක් වෙත ද පැමිණි අවස්ථා තිබේ.[2] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් උතුරේ සහ නැගෙනහිර දී සිදු කළ අදහස් විමසීම්වල දී අනාවරණය වූයේ බලපෑමට ලක් වූ ප්‍රජාවන් කොමිෂන් සභාවේ වරම සහ අරමුණු තබා කොමිෂන් සභාව පිළිබඳවවත් නොදැන සිටි බවයි. එබැවින්, සිය කටයුතු පිළිබඳව මෙන්ම, තමන් පිළිතුරු සැපයීමට අපේක්ෂා කරන ගැටලු සහ මහජන හමුවීම් පිළිබඳව මහජනයා දැනුවත් කිරීම කොමිෂන් සභාව විසින් සිදු කළ යුතුව ඇත. පළමු වටයේ මහජන හමුවීම් පවත්වනු ලැබුවේ පසුගිය වසරේ ජනවාරි මාසයේ දී වුව ද, කොමිෂන් සභාව විසින් 2014 වසර තුළ මහජන හමුවීම් වට නවයක් පැවැත්වීමෙන් පසුවත් පැහැදිලි ඉදිරි සැළැස්මක් නිර්මාණය කිරීමට තවමත් සමත් වී නැත.[3] සිය අනාගත කටයුතු පිළිබඳව ඉදිරි සැළැස්මක් සැකසීමට කොමිෂන් සභාව වහාම පියවර ගත යුතු අතර, සිය වරම පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතු ය.

1984 තරම් ඈත කාලයේ සිට යුද්ධයේ අවසන් අදියරේ දී මෙන් ම 2009 මැයි 19 වනදයින් පසුව ද සිදු වූ අතුරුදහන්වීම් පිළිබඳව පැමිණිලි කොමිෂන් සභාවට ලැබී ඇත. අතුරුදහන් වූ සිය ඥාතීන් හිතවතුන් සොයා මීට පෙර ද මෙවැනි මුල පිරීම් කිහිපයකට ම ගොස් ඇති බව කොමිෂන් සභාව හමුවට පැමිණි බොහෝ දෙනෙක් සඳහන් කළ හ. **කොමිෂන් සභාව ක්‍රියාත්මක වන්නේ මඳ වේගයකින්** බව[4] නිල සංඛ්‍යා ලේඛන[5] භාවිත කරමින් අවධාරණය කළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, එම සභාව වෙත ඉදිරිපත් වී ඇති පැමිණිලි සියල්ල ම අසා නිම කිරීමට පමණක් (විමර්ශනය කිරීමට නොවේ) වසර 13ක කාලයක් ගත වනු ඇති බව පෙන්වා දෙන ලදී. මේ වන විට පැමිණිලි 20,000ක සීමාව ද ඉක්මවමින් පැමිණිලි විශාල සංඛ්‍යාවක් ලැබී තිබුණ ද, කොමිෂන් සභාව මේ වන තෙක් කටයුතු කර තිබෙන වේගය සළකා බලන විට, කොමිෂන් සභාව විසින් මෙම පැමිණිලි අසා අවසන් කිරීම සඳහා **දැනට අනුගමනය කරමින් සිටින ක්‍රමවේදයේ වෙනසක් සිදු කිරීමට** කාලය එළඹ ඇත. මහජන හමුවක දී එක්රැස් කර ගනු ලබන තොරතුරු පරිගණකගත කිරීමට කොමිෂන් සභාවට සති පහක පමණ කාලයක් ගත වන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට දැන ගැනීමට ලැබුණි.[6] පැමිණිලි පරිගණකගත කිරීම සඳහා මීට වඩා කාර්යක්ෂම ක්‍රමවේදයක් භාවිත කළ යුතු බව විකල්ප ප්‍රතිපත්ති

---

[2] මුලන්කාවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැවති මහජන හමුවේ දී පැමිණිලි ඉදිරිපත් කළ පුද්ගලයන් පූනරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැවති මහජන හමුවට ද පැමිණිය හ. ඒ අවස්ථා දෙකම 2014 සැප්තැම්බර් මස දී කොමිෂන් සභාව විසින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දෙවන වටයේ මහජන හමු පැවැත්වූ අවස්ථා ය.

[3] ඉදිරියට යාමට ස්ථිර ඉදිරි සැළැස්මක අවශ්‍යතාව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර අවධාරණය කර තිබේ. බලන්නඃ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, "A Commentary on the Presidential Commission to Investigate Missing Persons during the periods of June 1990-May 2009 in the Northern and Eastern provinces", 2014 මාර්තු, මෙතැනින් ලබා ගන්නඃ http://www.cpalanka.org/a-commentary-onthe-presidential-commission-to-investigate-missing-persons/

[4] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, තොරතුරු රූප සටහන් (Infographic) අතුරුදහන් වූවන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව, 2014 සැප්තැම්බර් 11, බලන්නඃ http://www.cpalanka.org/infographic-presidential-commission-on-missing-persons/

[5] කොමිෂන් සභාව සම්බන්ධයෙන් 2014 සැප්තැම්බර් 11 දින දක්වා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ තොරතුරු රූප සටහන් (Infographic) හි භාවිත කර ඇති සංඛ්‍යා ලේඛන.

[6] කොමිෂන් සභාවේ සභාපති සහ ලේකම්වරයා සමග විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2014.10.29 දින පවත්වන ලද හමුව

කේන්ද්‍රය අවධාරණය කරයි. එකම දත්තය දෙවරක් ඇතුළු නොවන බවට වග බලාගත හැකි මෙන්ම, පැමිණිලි සම්බන්ධ විස්තර සහ සිද්ධි වාර්තා කොමිෂන් සභාවට සහ එහි කාර්ය මණ්ඩලයට නැවත පරීක්ෂා කර බැලීමට හැකි, කාර්යක්ෂම සහ පරිගණකගත දත්ත ඇතුළත් කිරීමේ පද්ධතියක් සහිත නව යාන්ත්‍රණයක් මීට ඇතුළත් කළ හැකි ය. කොමිෂන් සභාවට ලැබෙන තොරතුරු ඩිජිටල් තාක්ෂණයට පරිවර්තනය කිරීමේ හැකියාව ඇති, පහසුවෙන් පිවිසිය හැකි තාක්ෂණයක් වෙනුවෙන් කොමිෂන් සභාව ආයෝජනය කළ යුතු ය. ඉදිරියට ගමන් කිරීමේ දී සිදු වන ප්‍රමාදයන් මග හරවා ගැනීම සඳහා, පැමිණිලි පරිගණකගත කිරීම සහ ඩිජිටල් තාක්ෂණය මගින් කටහඬ පටිගත කිරීම හැරුණු විට, කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි ලේඛනගත කිරීම සහ ඒවා පිළිබඳ පසු විපරම් කිරීම සඳහා ඡායාරූප, ලිපි, කුවිතාන්සි සහ පුවත්පත් ලිපි ආදිය ස්කෑන් කිරීමේ ක්‍රම ද භාවිත කිරීම පිළිබඳව සළකා බැලිය යුතු ය. එවැනි මූල පිරිම් සිදු කිරීමට කොමිෂන් සභාව තුළ ඇති අකැමැත්ත හෝ නොහැකියාව හේතුවෙන්, ඉදිරිපත් වන ගැටලුවලට අවංකවම පිළිතුරු සෙවීමක් සිදු වෙතැයි බලාපොරොත්තු තබා ගත නොහැකි වී තිබේ. තව ද, එම අකැමැත්ත හෝ නොහැකියාව නිසා, කොමිෂන් සභාව විසින් තමන්ට ලැබී ඇති නිල පැවරුමට අනුව ක්‍රියා කිරීමෙහි ලා සිදු කරනු ලබන කාර්යක්ෂම සහ ඵලදායී ක්‍රියාවන්ට දැඩි ලෙස හානි පැමිණේ.

කොමිෂන් සභාවේ මහජන හමුවීම් පැවැත්වෙන අවස්ථාවල දී සිදු කරනු ලබන **පරිවර්තනවල ගුණාත්මකභාවය** පැමිණිලි විභාග කිරීමේ කටයුතු පැවැත්වුණු සමස්ත කාලය මුළුල්ලේම නැවත නැවතත් පැන නැගුණු ගැටලුවකි. මෙම ගැටලුව අවස්ථා ගණනාවක දී ම ඉස්මතු කර පෙන්වූව ද[7] ඊට විසඳුම් වශයෙන් කිසිදු පියවරක් ගෙන නැත. සාමාන්‍යයෙන් කොමිෂන් සභාව පැමිණිලි විභාග කරන දින තුනහමාරක කාලය තුළ වයස්ගත මහත්වරු දෙදෙනෙක් පූර්ණ කාලීනව පරිවර්තන කාර්යයෙහි යෙදී සිටිති. මහජන හමුවීම් පැවැත්වෙන අවස්ථාවල දී පරිවර්තනවල ගුණාත්මකභාවයේ සංගතබවක් (consistency) නොමැති බවත්, එම තත්ත්වය කොමිෂන් සභාව විසින් එක්රැස් කරගනු ලබන සියලුම තොරතුරු සහ එහි සමස්ත කටයුතුවලට බලපාන බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිරීක්ෂණය කරන ලදී. තව ද, වවුනියාවේ පැවති මෑතක දී අවසන් වූ හමුවේ දී, එක් පරිවර්තකයෙකු කොමසාරිස්වරුන් විසින් ප්‍රශ්න ඇසීමේ ක්‍රියාවලිය අරඹන තෙක් නොසිට තමන් විසින් ම ප්‍රශ්න ඇසීමට පටන් ගත් බව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිරීක්ෂණය කරන ලදී.[8] අතීතයේ සිදු වූ උල්ලංඝනයන්ට අදාළ ගැටලු පිළිබඳව ප්‍රශ්න ඇසීමට පරිවර්තකයෙකු තුළ ඇති නිපුණත්වය සහ එම අවස්ථාවේ එම ස්ථානයේ සිටි කොමසාරිස්වරුන් එම පුරුද්දට ඉඩ දුන්නේ ඇයිද යන්න ඇතුළු ගැටලු කිහිපයක් මෙවැනි ව්‍යවහාරයන් හේතුවෙන් ඉස්මතු වේ. **කොමිෂන් සභාවට ඉදිරිපත් වන සිදුවීම්වලට අදාළ ප්‍රධාන ගැටලු සහ බලපෑමට ලක් වූ ප්‍රදේශ පිළිබඳව පරිවර්තකයන් සහ කොමසාරිස්වරුන් තුළ සන්දර්භන්දයට අදාළ දැනුමක් නොමැතිකම** ද සැලකිය යුතු ය. පරිවර්තනවල අඩුපාඩු පෙන්වා දීමටත්, සාක්ෂි දෙමින් සිටින පුද්ගලයා පවසන්නේ සැබැවින්ම කුමක් ගැන ද යන්න කොමිෂන් සභාවට පෙන්වා දීමටත්, මහජන හමුවීම් සඳහා සහභාගි වී සිටි සිවිල් සංවිධානවල සාමාජිකයන්ට සහ මාධ්‍යවේදීන්ට සමහර අවස්ථාවල දී සිදු විය. මහජන හමුවීම් පැවැත්වීමට පෙර කොමිෂන් සභාව ඒ සඳහා පෙර සූදානම් වීමට පියවර ගත යුතු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධාරණය කරයි. සන්දර්භය සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන සිද්ධි වඩා හොඳින් ග්‍රහණය කර ගැනීම සඳහා, කොමිෂන් සභාවේ අදාළ නිලධාරීන්ට සහ පරිවර්තකයන්ට හමුව පැවැත්වීමට පෙර අදාළ ප්‍රදේශයේ සිවිල් සංවිධාන සහ ප්‍රජා කණ්ඩායම් හමු වීමට අවස්ථාවක් ලබා දීම මීට ඇතුළත් වේ. සිය ඥාතීන් අතුරුදහන් වීම පිළිබඳව නැවත විස්තර කිරීමේ දී සාක්ෂිකරුවන්ට නැවත නැවතත් මානසික කම්පනයට මුහුණ දීමට සිදු වීම ද මෙමගින් අවම වනු ඇත. එමෙන් ම, සත්‍ය සොයා ගැනීමට සහ යුක්තිය ඉටු කර ගැනීමට කොමිෂන් සභාවට අවංක උවමනාවක් ඇති බව එමගින් අනෙක් අයට අවබෝධ වනු ඇත.

[7] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශයෘ අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කරනු ලබන ජනාධිපති කොමිෂන් සභාවේ විභාග කටයුතු සම්බන්ධයෙන් පවතින ගැටලු (Concerns on the Proceedings of the Presidential Commission to Investigate into Complaints Regarding Missing Persons), 2014 ඔක්තෝම්බර් 2, බලන්නෘ http://www.cpalanka.org/concerns-on-the-proceedings-of-the-presidential-commission-to-investigate-into-complaints-regarding-missing-persons/

[8] වවුනියාවේ පැවති මහජන හමුවේ දී, 2014 දෙසැම්බර් 16

කොමිෂන් සභාවේ වරම පුළුල් කිරීමත් සමග අලුතින් එක් වූ ප්‍රශ්න හැරුණු විට, **එම සභාව විසින් අසනු ලබන ප්‍රශ්නවලින් වැඩි ප්‍රමාණයකට පිළිතුරු, ඔවුන් විසින් එක් එක් පැමිණිල්ලක් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන ලිපි ගොනුවේ දැනටමත් ගොනු වී ඇත.** අතුරුදහන් වූ පුද්ගලයාගේ අනන්‍යතාව, පැමිණිල්ල ඉදිරිපත් කරන පුද්ගලයාට ඇති නෑකම, ඔවුන් අතුරුදහන් වූයේ කුමන තත්ත්වයන් යටතේ ද, වැරදිකරුවන් බවට චෝදනා කරන්නේ කාටද, එවැනි චෝදනා තහවුරු කිරීමට ඇති සාක්ෂි යන මූලික ප්‍රශ්නවලට පිළිතුරු සෑම ලිපි ගොනුවක් තුළ ම ඇති බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට දැන ගැනීමට ලැබුණි.[9] දී ඇති තොරතුරු නිවැරදිදැයි නැවත තහවුරු කර ගැනීමට කොමිෂන් සභාවට ඇති වුවමනාව වැටහෙන නමුත්, සමහර සිද්ධිවලට අදාළව මහජන හමුවේ දී අසනු ලබන්නේ ද එම ප්‍රශ්න කිහිපය පමණක්ම බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සැලකිල්ලට ගන්නා ලදී. එකම ප්‍රශ්න නැවත නැවත ඇසීමෙන් පිළිතුරු සෙවීම අරමුණ කරගත් ක්‍රියාවලියකට වටිනාකමක් එක් වන්නේ නැත. කොමිෂන් සභාව විසින් සැබැවින්ම කළ යුතුව ඇත්තේ වින්දිතයා අතුරුදහන් වූ තත්ත්වයන් පිළිබඳව පසු විපරම් ප්‍රශ්න අසමින් ගැඹුරින් සෝදිසි කිරීමයි. මෙම පුරුද්ද නැවත සළකා බලා, කාර්යක්ෂම සහ ඵලදායී විමර්ශනයකට මග පෙන්වන ප්‍රමිතියකට අනුකූල වන ලෙස ප්‍රශ්න මාලාව සකසා ගැනීමට වග බලා ගන්නා ලෙසට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කොමිෂන් සභාවෙන් උදක්ම ඉල්ලා සිටී.

සැලකිල්ලට ගත යුතු තවත් කරුණක් වන්නේ කොමිෂන් සභාව විසින් යොද ගනු ලබන **ප්‍රශ්න මාලාව තුළ අතුරුදහන්වීම් පිළිබඳව ඉලක්ක වී ඇති ආකාරය**යි. කොමිෂන් සභාවේ වරම පුළුල් කිරීමෙන් පසුව, අතුරුදහන්වීම්වලට ඔබ්බෙන් ඇති කරුණු පිළිබඳව ද විමර්ශනය කිරීමට කොමිෂන් සභාවට අවසර ලැබේ. එහෙත් යුධ සමයේ දී සිදු වූ මානව හිමිකම් සහ මානවවාදී නීති උල්ලංඝනයවීම් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කරන ලෙස මහජනතාව වෙත දැනුම්දෙනු ලැබුවේ[10] 2014 නොවැම්බර් මාසයේ දී තරම් මෑතක දී ය[11]. එම නිසා, වර්තමානයේ කොමිෂන් සභාව හමුවට පැමිණෙන්නේ සිය ඥාතීන් අතුරුදහන්වීමට අදළ නිශ්චිත සිදුවීම් පිළිබඳව පැමිණිලි කර ඇති පිරිසකි. අතුරුදහන්වීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු නොකොට, අතුරුදහන් වූවන් පිළිබඳව පැමිණිලි කර ඇති පුද්ගලයන්ගෙන් වෙනත් කරුණු ගැන විමර්ශනය කිරීම කොමිෂන් සභාව හමුවට පැමිණෙන්නන්ට කරන බලවත් අසාධාරණයකි. එමෙන් ම, අතුරුදහන්වීම් සම්බන්ධයෙන් පිළියම් ලබා දීම සඳහා මුල පිරීමක් ලෙස කොමිෂන් සභාව ස්ථාපනය කළ බව පැවසුව ද, මෙවැනි ක්‍රියා මගින් එහි විශ්වාසනීයත්වයට බලපෑමක් ඇති වේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මීට පෙර අවධාරණය කළ පරිදි[12], මෙම කරුණ, ගැටලු විශාල ගණනාවක් පිළිබඳව විමර්ශනය කිරීමට හැකි වන ලෙස කොමිෂන් සභාවේ වරම පුළුල් කිරීමෙහි නිශේධනාත්මක ප්‍රතිඵලවලින් එකක් පමණි.

මහජන හමුවීම්වල ස්වභාවය සළකා බලන කල, **අවශ්‍ය නම් රහසිගතව සාක්ෂි ලබා දීමේ අවස්ථාව ඇති බව කොමිෂන් සභාව විසින් තමන් හමුවට පැමිණෙන පුද්ගලයන්ට දැනුම් දීම** අතිශය වැදගත් වේ. මෙය කොමිෂන් සභාව 2014 මුල භාගයේ සිදු කළ මහජන හමුවීම්වල දී අනුගමනය කිරීමට එකඟ වූ වැදගත් භාවිතයකි. කෙසේ වුව ද, වර්තමානයේ මෙම භාවිතය ක්‍රමානුකූලව සිදු නොවන අතර, සියලු ම මහජන හමුවීම්වල දී එය එක ම අයුරින් සිදු වන්නේ ද නැත. විශේෂයෙන් සාක්ෂිකරුවන් සහ වින්දිතයන් සුරැකීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවන තත්ත්වයක් යටතේ මෙම විමර්ශන සිදු වන නිසා, කොමිෂන් සභාව හමුවට පැමිණ සංවේදී පැමිණිලි ඉදිරිපත් කරන

---

9 කොමිෂන් සභාව විසින් දත්ත එක්රැස් කරගනු ලබන ෆෝරමයෙන් ලබා ගත් ප්‍රශ්න මෙතැනින් බලන්න: http://www.pcicmp.lk/images/site/questionnaire%20format%20english.pdf

10 මහජනතාව වෙත කරනු ලබන දැන්වීම- බලන්න: http://www.pcicmp.lk/images/Notice%20Extended%20the%20Scope%20-%20English.pdf

11 කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇති මහජනතාව වෙත කරනු ලබන දැන්වීම 2014 ඔක්තෝම්බර් 10 දින නිකුත් කළ බවට දිනය යොද තිබුණ ද, මෙම නිවේදනය මහජනතාව වෙත නිකුත් කරනු ලැබුවේ 2014 නොවැම්බර් මස 16 දින ය. බලන්න: *Missing Persons Commission to consider Civilian casualties and 'Rule of War'- Whether LTTE was subjected to international humanitarian law,* ජනාධිපති මාධ්‍ය ඒකකය, 2014 නොවැම්බර් මස 16, මෙතැනින් ලබාගන්න: http://www.defence.lk/new.asp?fname=Civilian_casualties_and_Rule_of_War_20141116_02

12 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය: බලන්න: http://www.cpalanka.org/concerns-on-the-proceedings-of-the-presidential-commission-to-investigate-into-complaints-regarding-missing-persons/

බලපෑමට ලක් වූ පුද්ගලයන්ට ඉතා අනතුරුදායක ප්‍රතිඵලවලට මුහුණ දීමට ඉඩ තිබේ. සාක්ෂිකරුවන් සහ වින්දිතයන් සුරැකීමේ ශක්තිමත් සහ විශ්වාසනීය යාන්ත්‍රණයක් හඳුන්වා දෙන නීතියක අවශ්‍යතාව මේ සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යළිත් අවධාරණය කරයි.[13]

**පුළුල් ගැටලු**

2014 ජුලි මස දී කොමිෂන් සභාව විසින් මුලතිව් දිස්ත්‍රික්කයේ පළමු වටයේ මහජන හමුවීම් පවත්වා අවසන් වූ පසුව, අංක 1871/18 දරණ ගැසට් නිවේදනය මගින් කොමිෂන් සභාවේ නිල පැවරුම පුළුල් කරන ලදී. ඒ ජාත්‍යන්තර මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානවවාදී නීති උල්ලංඝනයන් පිළිබඳ චෝදනා සොයා බැලීම සඳහා ය. මුලතිව් දිස්ත්‍රික්කයේ පැවති හමුවීම්වල දී කොමිෂන් සභාව විසින් අසන ලද ප්‍රශ්නවල පැහැදිලි වෙනසක් දක්නට ලැබුණි. මුලතිව් දිස්ත්‍රික්කයේ මහජන හමුවීම්වල දී වැඩිපුර ම ඉදිරිපත් වූයේ 2009 වසරේ යුද්ධයේ අවසන් අදියරේ දී සිදු වූ අතුරුදහන්වීම් පිළිබඳ සිද්ධි ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රධාන කරුණු දෙකක් මත කොමිෂන් සභාවේ පුළුල් කරන ලද නිල පැවරුම පිළිබඳව සිය සැලකිල්ල යොමු කරන ලදී.[14]

පළමුව, මෙම කොමිෂන් සභාව පිහිටුවනු ලැබුවේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ මත ය. අතුරුදහන්වීම් සහ පැහැරගෙනයාම්වල පරිමාණය සහ සංවේදී ස්වභාවය හේතුවෙන්, අතුරුදහන්වීම් පිළිබඳව පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ඒ සඳහා ම වෙන් වූ සහ කැප වූ යාන්ත්‍රණයක් පත් කළ යුතු බව එම කොමිෂන් සභාව විසින් විශේෂයෙන් නිර්දේශ කරන ලදී. අතුරුදහන්වීම්වලට ඍජුව අදාළ නොවන වෙනත් විමර්ශන මගින් කොමිෂන් සභාවේ කාර්ය භාරය සංකීර්ණ කිරීම උගත් පාඩම් හා සමගි සන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ වෙනස් කිරීමක් පමණක් නොව, එය **කොමිෂන් සභාවේ මූලික ඉලක්කය දියාරු කරමින් කොමිෂන් සභාව මත ප්‍රායෝගික නොවන මට්ටමකට බර පැටවීමේ** අවදානමක් ද ඇති කරයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් ඉස්මතු කරන ලද මෙම ගැටලු වර්තමානයේ සැබෑ වී ඇත. **කොමිෂන් සභාව හමුවේ ඇති විශාල කාර්ය භාරය හමුවේ අතුරුදහන්වීම් පිළිබඳව සොයා බැලීම පසෙකට තල්ලු වී තිබේ.** කොමිෂන් සභාව මත දැනටමත් පැටවී ඇති අධික බර තවත් වැඩි කරමින්, බලපෑමට ලක්වූවන්ට ජීවනෝපාය සඳහා සහය වීම, ඉඩම් සම්බන්ධ ගැටුම් නිරාකරණය සහ උපදේශන සේවා සැපයීම සඳහා වැඩසටහනක් සැකසීම ආදී උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් ද කොමිෂන් සභාව කටයුතු කරන බව මෑතක දී වාර්තා විය[15]. මේවා පශ්චාත් යුධ සමයේ සමගි සන්ධානයෙහි ලා අත්‍යවශ්‍ය අංග වුව ද, එවැනි නා නා විධ වූ ගැටලු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට තරම් කොමිෂන් සභාවට මානව සම්පත සහ විශේෂඥ දැනුමක් නැත. විකල්ප ගැටුම් නිරාකරණ යාන්ත්‍රණයක් ලෙස හඳුනාගනු නොලැබීමට නම්, සිය තත්ත්වය සහ වරම තහවුරු කර ගැනීමට කොමිෂන් සභාව කටයුතු කළ යුතු ය. කොමිෂන් සභාවට සිය විෂයය පථය සම්බන්ධයෙන් පැහැදිලි වරමක් ලැබී තිබුණ ද, අතුරුදහන් වූවේ යැයි පැමිණිලි ලැබුණු දහස් ගණනක් පුද්ගලයන්ට අත් වූ ඉරණම සම්බන්ධයෙන් පිළිතුරු සෙවීමෙහි ලා කොමිෂන් සභාව විසින් අත් කරගෙන ඇති ප්‍රගතිය සැබැවට ම ගැටලුකාරී ය. එම නිසා, කොමිෂන් සභාවේ ඉලක්කය විවිධ අතට විසිරී යාම හේතුවෙන් යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ සැබෑ අවශ්‍යතාවලට පිළියම් යෙදීමේ කටයුත්තට හානි සිදුනොවිය යුතු ය.

---

13 වර්තමානයේ ශ්‍රී ලංකාවේ සාක්ෂිකරුවන් සහ වින්දිතයන් සුරැකීමේ නීතියක් නොමැත. ඒ සඳහා නීති පැනවීමට වසර කිහිපයක් තිස්සේ ප්‍රයත්න දරා තිබුණ ද, ඒ එකක්වත් මේ වන තෙක් පාර්ලිමේන්තුව දක්වා ගොස් නැත.

14 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශයඃ අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා වන විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ (Commission of Inquiry) වරම පුළුල් කිරීමට අදාළ ගැටලු (Concerns on the Expansion of the Mandate of the Commission of Inquiry to Investigate into Complaints Regarding Missing Persons) 2014 ජුලි 25, බලන්නඃ http://www.cpalanka.org/concerns-on-the-expansion-of-the-mandate-of-the-commission-of-inquiry-to-investigate-into-complaints-regarding-missing-persons/

15 *Missing Persons Commission has acted promptly to deal with complaints,* ඩේලි නිවුස්, 2014 දෙසැම්බර් 2, මෙතැනින් ලබාගන්නඃ
http://www.defence.lk/new.asp?fname=Missing_Persons_Commission_has_acted_promptly_to_deal_with_complaints_20141202_01

දෙවනුව, **ජාත්‍යන්තර විශේෂඥයන්ගෙන් සැදුම්ලත් උපදේශක සභාවට (උපදේශක සභාව) ලබා දී ඇති යොමු කිරීම් අනුදේශ (terms of reference) අපැහැදිලි වීමේ** ගැටලුව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් ඉස්මතු කරන ලදී. මේ වන විට උපදේශක සභාව සඳහා හය දෙනෙකු පත් කර තිබේ[16]. උපදේශක සභාවේ සාමාජිකයන් මේ දක්වා කොමිෂන් සභාව විසින් පවත්වන ලද එකදු මහජන හමුවකට හෝ සහභාගි වී නොතිබුණ ද, කොමිෂන් සභාවේ නිල පැවරුම සම්බන්ධයෙන් විග්‍රහ කිරීමෙහි ලා උපදේශක සභාව විසින් ලබා දුන් උපදේශයක් තමන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වූ බව කොමිෂන් සභාව සඳහන් කර තිබේ.[17] මෙම උපදේශය මෙතෙක් මහජනතාවට බලා ගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් කර නොමැතිකමින් කොමිෂන් සභාව සමග කටයුතු කිරීමේ දී උපදේශක සභාවෙහි නිශ්චිත භූමිකාව කුමක්ද යන්න තවත් ව්‍යාකූල වේ. උපදේශක සභාවේ නිල පැවරුම සහ කාර්ය සම්බන්ධයෙන් දැනට වඩා විනිවිදභාවයක් ඇති වීමේ අවශ්‍යතාව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යළි අවධාරණය කරයි. මීට අදාළව, සත්‍යය, යුක්තිය සහ වගවීම සොයා යාමෙහි ලා සිය භූමිකාව කුමක්දැයි උපදේශක සභාව විසින් සිවිල් සමාජය සහ ප්‍රජා කණ්ඩායම් මුණගැසී පැහැදිලි කර දීමේ අවශ්‍යතාව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉස්මතු කරයි. විනිවිද භාවය සහිත මෙන් ම, සියල්ල අන්තර්ගත වන අන්දමේ ක්‍රියාවලියක් පැවතීම මගින්, සමගි සන්ධානය (reconciliation) සහ සංක්‍රමණීය යුක්තිය (transitional justice) සඳහා අවංකව සිදු කිරීමට උත්සාහ කරන ක්‍රියාවලියට හානි කිරීම සඳහා විධායකය විසින් උපදේශක සභාව භාවිත කරතැයි යන බිය පළවා හරිනු ලබනවා පමණක් නොව, දැනට අනුගමනය කරමින් පවතින ක්‍රියාවලියෙහි ලා එම සභාවේ භූමිකාව සම්බන්ධයෙන් ද පැහැදිලිතාවක් ලබා දේ.

**සාක්ෂිකරුවන් සහ වින්දිතයන් සුරැකීමේ යාන්ත්‍රණ නොමැති වීම** ද දිගින් දිගට ම පවතින ගැටලුවකි. මහජන හමුවීම් විනිවිද භාවයකින් යුක්ත වීම සඳහා ඒවා ප්‍රසිද්ධියේ පැවැත්වීම අවශ්‍ය බව පවසන කොමිෂන් සභාව, එවැනි මහජන හමුවක් සඳහා අවශ්‍ය රැකවරණය ලබා දීමට අසමත් වී තිබේ. උතුරේ විශාල වශයෙන් හමුදාව ස්ථානගත කර තිබීමේ සහ සාක්ෂිකරුවන් සහ වින්දිතයන් සුරැකීමේ නීති නොමැති වීමේ සන්දර්භය තුළ මෙම තත්ත්වය විශේෂයෙන් ගැටලුකාරී වේ. මහජන හමුවීම් පැවැත්වීමේ දී මෙන් ම ඉන් බාහිරව ද ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක හමුදා නිලධාරීන් විසින් යම් බලපෑම් සිදු කර ඇති අවස්ථා ගණනාවක් පිළිබඳව වාර්තා වුව ද, ඒවා නැවත සිදුවීම වැළැක්වීම සඳහා කොමිෂන් සභාව විසින් කිසිදු පියවරක් ගෙන නැත. සිවිල් ඇඳුමින් සැරසුණු ආරක්ෂක හමුදා නිලධාරීන් මහජන හමුවීම්වලට සහභාගි වී, ඒවාට සහභාගි වී පැමිණිලි ඉදිරිපත් කරන පුද්ගලයන් සුපරීක්ෂාකාරී ලෙස නිරීක්ෂණය කර ඇත. සමහර අවස්ථාවල දී මහජන හමුවීම් සඳහා සහභාගි වන පුද්ගලයන් ඔවුන් විසින් ඡායාරූපගත කරනු ලැබ ඇත.[18] අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාසය විසින් අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ නිවෙස්වලට පැමිණ හෝ ඔවුන් අමතා අතුරුදහන් වූ පුද්ගලයා පිළිබඳව විමසා ඇති අතර, සමහර අවස්ථාවල දී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පිළිබඳව ද විමසා ඇත[19]. සමහර අවස්ථාවල දී, කොමිෂන් සභාව වෙත ගොස් පැමිණිලි කරන ලෙස අතුරුදහන් වූවන්ගේ පවුල්වල අය උනන්දු කරනු ලැබ, ඔවුන්ට රජයේ ආරක්ෂක හමුදා විසින් මහජන හමුවීම පැවැත්වෙන ස්ථානය වෙත යාම සඳහා ප්‍රවාහන පහසුකම් පවා ලබා දී ඇති අතර,[20] තවත් සමහර අවස්ථාවල දී මහජන හමුවීම් සඳහා සහභාගි නොවන ලෙසට එම පවුල්වල සාමාජිකයන් බිය වද්දා

---

[16] මහාමාන්‍ය ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා, රාජ නීතිඥ (සභාපති); ශ්‍රීමත් ජෙෆ්රි නයිස්, රාජ නීතිඥ; මහාචාර්ය ඩේවිඩ් ක්‍රේන්; අව්ධාශ් කෞෂාල් මැතිතුමා; අහමර් බිලාල් සූෆි මැතිතුමා; මොටු නොගුචි මැතිතුමා.

[17] *විශේෂඥ කණ්ඩායම සහ අවතැන් වූවන් පිළිබඳ කොමිෂන් සභව අතර සාකච්ඡා පැවැත්වේ* (*Expert Panel and Missing Persons Commission hold discussion),* ජනාධිපති මාධ්‍යය ඒකකය, 2014 ඔක්තෝම්බර් 20, මෙතනින් ලබාගන්න: http://www.defence.lk/new.asp?fname=Expert_Panel_and_Missing_Persons_Commission_hold_discussion_20141020_01

[18] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය: බලන්න: http://www.cpalanka.org/concerns-on-the-proceedings-of-the-presidential-commission-to-investigate-into-complaints-regarding-missing-persons/

[19] බිම් මට්ටමේ සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමග විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිදු කළ සම්මුඛ සාකච්ඡා. මෙම ක්‍රියාකාරීන් අතුරින් සමහර දෙනා අතුරුදහන් වූවන්ගේ පවුල්වල ඥාතීන් වෙනුවෙන් කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කර තිබේ.

[20] 2014 සැප්තැම්බර් මස කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැවති මහජන හමුවීමක දී පැමිණිලි ඉදිරිපත් කළ කිහිප දෙනෙකුට ම හමුවීම සිදුවන ස්ථානයෙන් බැහැර දී ශ්‍රී ලංකා රජයේ හමුදා විසින් ප්‍රවාහන පහසුකම් ලබා දෙනු දක්නට ලැබුණි.

තිබේ.[21] මෙම කොමිෂන් සභාවෙහි හැරුණු විට වෙනත් ස්ථානයක ලියාපදිංචි වී හෝ වාර්තාගත වී නොමැති, අතුරුදහන්වීම් පිළිබඳ සමහර සිද්ධි පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාසය දැනුවත් වී ඇති බව පෙනී ගොස් තිබේ.[22] විශේෂයෙන් හමුදාකරණය වූ තත්ත්වයක් උතුරේ පවතිද්දී සහ යුද සමයේ දී සිදු වූ දරුණු ක්‍රියා පිළිබඳව සත්‍යය සොයන අය පළිගැනීමට ලක්වෙතැයි බියක් පවතිද්දී, මෙතරම් දැඩි ලෙස බාධා කිරීම, බිය වැද්දීම සහ ආවේක්ෂණ (surveillance) සිදු කිරීමෙන්, ඉතා සංවේදී කරුණු පිළිබඳව සොයා බලන කොමිෂන් සභාවක කටයුතුවලට උපකාරයක් සිදු නොවේ.

කොමිෂන් සභාව පිහිටුවනු ලැබූ 2013 අගෝස්තු මස සිට මේ දක්වා වසරකට අධික කාලයක් ගත වී තිබේ. කෙසේ වුව ද, **මෙතෙක් කල් අසන ලද පැමිණිලිවල තත්ත්වය පිළිබඳව යාවත්කාලීන කිරීමක් සිදු කර නොමැත**. වසර තුළ අතුරු වාර්තාවක් නිකුත් වෙතැයි අපේක්ෂා කළ ද, මේ වන තෙක් එවැනි වාර්තාවක් ප්‍රසිද්ධියට පත් කර නැත. සිය පැමිණිල්ලේ තත්ත්වය පිළිබඳව දැන ගැනීමට මෙන් ම, සත්‍යය සහ යුක්තිය සෙවීමේ ව්‍යායාමයේ දී තමන් විසින් අපේක්ෂා කළ යුත්තේ කුමක්දැයි දැන ගැනීමට කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කළ පුද්ගලයන්ට අයිතියක් තිබේ.

**ප්‍රත්‍යක්ෂ වූ කරුණු සහ සැළකිල්ලට භාජනය විය යුතු කරුණු**

තමන්ට ලැබුණු සහනය කුමක්දැයි අතුරුදහන් වූ පුතු සොයමින් සිටින එක් මවකගෙන් ඇසූ විට ඇගේ පිළිතුර වූයේ "මට මුකුත් ලැබුණේ නැහැ. මට මුකුත් ඕනෑත් නැහැ. ඒත් මට මගේ පුතා ඕනෑ" යන්නයි.[23] කොමිෂන් සභාව හමුවේ එවැනි හැඟීම්බර වදන් පැවසීම නිතර ම පාහේ සිදු වේ. එවැනි ප්‍රකාශ සිදු කරනු ලබන වාර ගණන අනුව පෙනී යන්නේ අතුරුදහන් වූවන්ගේ පවුල්වල අය **වැඩිමනත් කොමිෂන් සභාව ඉදිරියට පැමිණෙන්නේ සත්‍ය දැන ගැනීමේ අරමුණෙන්** බව ය. 'සාධාරණ සහනයක්' ලැබී ඇත්දැයි විමර්ශනය කිරීම කොමිෂන් සභාවේ නිල පැවරුම යටතේ සිදු කළ යුතු දෙයක් වුව ද, වැඩි දෙනෙකු දවසේ ආදායම ද කැප කරගෙන බොහෝ දුරු කතර ගෙවාගෙන පැමිණෙන්නේ සිය ප්‍රශ්නවලට පිළිතුරක් දැන ගැනීමේ අරමුණෙනි. අතුරුදහන් වූ සිය ඥාතියා සොයා දෙන ලෙස ඥාතීන් සමහර අවස්ථාවල කොමිෂන් සභාවෙන් දැඩිව ඉල්ලා සිටින්නේ වසර ගණනාවකට පසුව වුව ද ඔවුන් තවමත් ජීවතුන් අතර ඇති බවට විශ්වාස කරන නිසා ය. දශක ගණනාවක් තිස්සේ රැඳවුම් මධ්‍යස්ථානවල සිට ආපසු පැමිණි පුද්ගලයන් පිළිබඳව වාර්තා මෑතක දී පළ වීමත් සමග[24], අතුරුදහන් වූ සිය ඥාතීන් කවදා හෝ ආපසු පැමිණෙතැයි විශ්වාස කරන අයට ද ඒ පිළිබඳව බලාපොරොත්තු තබා ගැනීමට හැකි වී තිබේ. ආගමික වතාවත් සිදු කර අවසානයක් දැකීම සඳහා අවම වශයෙන් සිය ඥාතීන්ගේ සිරුරු හෝ සොයා දෙන ලෙස තවත් සමහර අවස්ථාවල පවුල්වල සාමාජිකයන් කොමිෂන් සභාව ඉදිරියේ ආයාචනය කර ඇත. ඒ අනුව, ඔවුන්ගේ හඬට සවන් දී, පිළිතුරු සෙවීම සඳහා ඔවුන්ට ඇති සුවිශේෂී අවශ්‍යතාවට පිළියම් යෙදීම කෙරෙහි කොමිෂන් සභාවේ ප්‍රමුඛතාව ඒකාන්තයෙන් හිමි විය යුතු ය.

අතුරුදහන් වූවන්ගේ ඥාතීන් කොමිෂන් සභාව කෙරෙහි කෙතරම් විශ්වාසයක් තබා ඇත්ද යන්නට තමන්ට ලැබෙන අති විශාල පැමිණිලි සංඛ්‍යාව සාක්ෂි දරන බව කොමිෂන් සභාව යළි යළිත් තරයේ ප්‍රකාශ කරයි. මෙම කොමිෂන් සභාව හමුවට පැමිණෙන පුද්ගලයන් අතුරින් වැඩි දෙනෙකු මීට පෙර ද වෙනත් කොමිෂන් සභා ගණනාවක් හමුවට ගියත් ඉන් යහපත් ප්‍රතිඵලයක් ලැබී නැත. බහුතරයක් සිද්ධිවල දී ඥාතීන් විසින් පොලීසියට, ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවට සහ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට පැමිණිලි කර තිබුණ ද, අතුරුදහන් වූ සිය ඥාතීන් කොහේ සිටින්නේ ද යන්න පිළිබඳව හෝ ඔවුන්ට සිදු වූයේ කුමක්ද යන්න පිළිබඳව යන්තමින් හෝ සත්‍යය අනාවරණය කර ගැනීමට හැකි වී නැත. මහජන හමුවීම් අතරතුර දී කිහිප දෙනෙකුම මේ බව සඳහන් කරමින්, එවැනි

---

[21] 2014 අගෝස්තු මස දී කොමිෂන් සභාව විසින් මන්නාරමේ දී පැවැත්වූ හමුවීමේ දී සිවිල් සමාජ සාමාජිකයන් විසින් මෙම ගැටලු ඉස්මතු කරන ලදී.

[22] උතුරේ සහ නැගෙනහිර සිවිල් සමාජ සහ ප්‍රජා කණ්ඩායම්වලින් ලද තොරතුරු මත පදනම් වී ඇත.

[23] බටහිර මාන්තායි ප්‍රදේශයේ සිදු කෙරුණු මහජන හමුවේ දී ය, 2014 අගෝස්තු 09

[24] *Long thought dead, man returns home after 25 year detention,* ද සන්ඩේ ටයිම්ස්, 2014 දෙසැම්බර් 14, මෙතැනින් ලබාගන්න:http://www.sundaytimes.lk/141214/news/long-thought-dead-man-returns-home-after-25-year-detention-132458.html

ව්‍යායාමයක නිෂ්ඵලභාවය පිළිබඳව කොමිෂන් සභාවෙන් හැඟීම්බර ලෙස ප්‍රශ්න කර තිබේ. සිය ඥාතීන් සොයමින් සිටින පුද්ගලයන්ගේ එවැනි ආවේගශීලී ප්‍රකාශ මගින් මෙම තත්ත්වයේ බරපතළකම මනාව පෙනී යයිඃ බලපෑමට ලක් වූ දහස් ගණනක් පුද්ගලයන් අත් විඳි කම්පනය, දුක්ගැනවිලිවලට විසඳුම් ලබා දීමට රජය විසින් අවංකව සහයෝගය ලබා නොදීම, පිළිතුරු ලබා දීමට බැඳී සිටි මීට පෙර පැවති ආයතන මගින් සිදු කරන ලද නොමග යැවීම් සහ, විමර්ශන සහ විභාග සිදු කර වැරදිකරුවන්ට දඬුවම් ලබා දිය යුතු ආයතන සිය රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් ඔවුන්ට දඬුවමක් ලබා නොදීමේ සංස්කෘතියක් ගොඩ නැගෙමින් තිබීම මේ අතර වේ. රජය සහ කොමිෂන් සභාව විසින් කුමන අයුරින් අර්ථ කථනය කළ ද, කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලිවලින් වැඩි ප්‍රමාණයක් ලැබෙනුයේ සිය **ඥාතීන් සොයා ගැනීම සඳහා පවතින සියලුම ක්‍රමවේද සහ යාන්ත්‍රණ යොදා ගැනීමේ අවශ්‍යතාවය ඇති** පුද්ගලයන්ගෙන් බව නිගමනය කළ හැකි ය.

**කොමිෂන් සභාව විසින් භාවිත කරනු ලබන ප්‍රශ්න මාලාව අත්‍යන්තයෙන් ම පක්ෂපාතීත්වයෙන් යුක්ත බව** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මීට පෙර සඳහන් කරන ලදී.[25] කොමිෂන් සභාව විසින් අසනු ලබන නියමු ප්‍රශ්න (මුවින් පිළිතුර පිට වන අයුරින් සැකසූ ප්‍රශ්න) මගින් වාචික සාක්ෂිවලට බලපෑම් කළ හැකි අතර, එමගින් ඊට පසුව කරන සොයා ගැනීම්වලට ද බලපෑමක් ඇති විය හැකි ය. අපක්ෂපාතීව සහ ස්වාධීනව කටයුතු කිරීම කොමිෂන් සභාවේ සාර්ථකත්වයට අතිශය වැදගත් වේ. තව ද, සමහර අවස්ථාවල දී, අදාළ පුද්ගලයා අතුරුදහන් වූ ආකාරය පිළිබඳව ප්‍රශ්න අසමින් සිටින අතරතුර, අතුරුදහන් වූ පුද්ගලයා අවසන් වරට දකිනු ලැබුවේ ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට භාර වන අවස්ථාවේ බවට සාක්ෂිකරුගෙන් ප්‍රකාශ වුවහොත්, ඒ සමග ම කොමිෂන් සභාවේ ප්‍රශ්න කිරීම් එක් වරම නවතින බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිරීක්ෂණය කර තිබේ. ඊට අමතරව, ජීවනෝපාය සහය සම්බන්ධ ප්‍රශ්න ඇසීමට කොමිෂන් සභාවේ උනන්දුවක් ඇති බව ද, අතුරුදහන් වූ සිය ඥාතීන් ශ්‍රී ලංකා රජය විසින් පාලනය වන ප්‍රදේශයකට ඇතුළු වන බව දුටු බවට සඳහන් වන සාක්ෂි කොමිෂන් සභාව විසින් තරමක් දුරට නොසළකා හැරීමට උත්සාහ කරන බව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිරීක්ෂණය කර තිබේ.

ප්‍රශ්න අසන ආකාරය මෙන් ම, සමහර වාචික සාක්ෂිවලට කොමිෂන් සභාව දක්වන ප්‍රතිචාර ද **අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ගේ දුක්ගැනවිලි පිළිබඳව සංවේදීබවකින් තොර** ය. ප්‍රශ්න මාලාව සම්බන්ධයෙන් ගැටලු මතු වන අවස්ථා පිළිබඳව මහජන හමු දෙකකින් උපුටාගත් නිදසුන් පහත දැක්වේඃ

අතුරුදහන් වූ සිය සැමියා සොයන බිරිඳකගේ සාක්ෂියෙන් පළමු උපුටා ගැනීම සිදු කර ඇතඃ[26]

*අතුරුදහන් වූ පුද්ගලයාගේ බිරිඳඃ ...මගේ මහත්තයා ඕමන්තෙයි හමුද කඳවුරේ දී දැක්කා කියලා එයාව දැකපු කීප දෙනෙක් ඇවිත් කිව්වා. ඒ කඳවුර ඇතුළේ වැඩ කරපු ගොඩක් දෙනෙකුත් හිටියා, ඒගොල්ලොත් මට කිව්වා මගේ මහත්තයාව දැකලා තියනවා කියලා...* (කොමිෂන් සභාවෙන් ප්‍රශ්නයක් අසයි) *එයා එල්.ටී.ටී.ඊ. කඳවුරෙන් පැනලා ඇවිත් හමුද පාලනය තියන ප්‍රදේශයට ආවා...* (කොමිෂන් සභාවෙන් ප්‍රශ්නයක් අසයි) *මම මහත්තයා හොයාගෙන වන්නි පළාතේ හැම තැනම ගිහින් තියනවා. හැමෝම මට කිව්වේ ඊට සමාන තොරතුරු තමයි.*

*කොමිෂන් සභාවෙන්ඃ ඔය ලැබිලා තියන උදව්වල හැටියට තමා මේ කොමිෂන් සභාවේ සභාපති වෙන්නයි තිබුණේ.*

[25] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශයඃ බලන්නඃ http://www.cpalanka.org/concerns-on-the-proceedings-of-the-presidential-commission-to-investigate-into-complaints-regarding-missing-persons/

[26] මන්නාරමේ පැවති මහජන හමුව, 2014 අගෝස්තු 10

අතුරුදහන් වූ සිය දියණිය සොයන මවකගේ සාක්ෂියෙන් දෙවන උපුටා ගැනීම සිදු කර ඇත:[27]

*අතුරුදහන් වූ තැනැත්තියගේ මව: අපි දුවනකොට එයා අතුරුදහන් වුණා.*

*කොමිෂන් සභාවෙන්: ඒ කියන්නේ තමන් දුවනකොට දුවට මොකද වෙන්නෙ කියලා බැලුවේ නෑ? දුවත් තමන් එක්ක එනවාද කියලා? දුවත් තමන් එක්ක දුවනවාද කියලා බැලුවෙ නැද්ද?*

**යුද්ධයක් අවස්ථාවේ පවතින තත්ත්වය, ඔවුන් ලැබූ අත්දැකීම් සහ ඔවුන්ගේ ඥාතීන් අතුරුදහන් වූ පසුබිම පිළිබඳව, කොමිෂන් සභාව මෙන් ම සමහර අවස්ථාවල පරිවර්තකයන් ද එතරම් සහකම්පනයක් සහ අවබෝධයක් පෙන්වා නැත**. තව ද, තමන් හමුවට පැමිණෙන පුද්ගලයන්ගෙන් ප්‍රශ්න ඇසීමට පෙර කොමිෂන් සභාව විසින් උපකල්පන සහ පූර්ව මතයන් ඇති කරගෙන සිටින බවට ඉහත ප්‍රශ්න මාලාව අනුව පෙනී යයි.

මහජන හමුවීම් සඳහා සහභාගි වන්නන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සමබර කිරීම පිළිබඳව ද සැලකිලිමත් වීම වැදගත් ය. **අතුරුදහන් වූ පුද්ගලයන්ගෙන් බහුතරය පිරිමි අය බවත්, පැමිණිලි ඉදිරිපත් කරන බහුතරය කාන්තාවන්** බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිරීක්ෂණය කරන ලදී. එබැවින් **ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී වන අයුරින් ප්‍රශ්න සහ ක්‍රමවේදයන්** සැකසීමේ අවශ්‍යතාවක් ඇත. අතුරුදහන් වූවන්ගේ පවුල් වැඩි සංඛ්‍යාවකට පවුලේ මූලික උපයන්නා අහිමි වී ඇති අතර, ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල කාන්තාවන් ගෘහ මූලිකත්වය උසුලන පවුල් දහස් ගණනක් ඇත. සමහර සිද්ධිවල දී කොමිෂන් සභාව කටයුතු කළේ මෙම විවිධත්වය පිළිබඳව අවධානයක් සහ සංවේදීතාවක් නොමැතිව බව පෙනී ගිය අතර, විශේෂයෙන් කිසිදු මූල්‍ය සහයක් හෝ ආදයම් ඉපයීමක් නොමැති, එක් සාමාජිකයෙකු පමණක් සිටින පවුල් සම්බන්ධයෙන් මෙම තත්ත්වය දැකිය හැකි විය. තව ද, **මහජන හමුවීම් වෙත පැමිණ කරුණු ඉදිරිපත් කිරීම සඳහා අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයන්ට කිසිදු සහයක් නොලැබේ**. දවස මුළුල්ලේ මහජන හමුවීමට සහභාගි වෙමින් පැමිණිලි ඉදිරිපත් කරන ඔවුන්ට දවසේ ආදයම ඒ වෙනුවෙන් කැප කිරීමට සිදු වීම නිසා ඔවුන්ගේ ජීවනෝපායට ඉන් විශාල බලපෑමක් ඇති වීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව නිසි වැදගත්කමක් හෝ සහයක් ලබා දී නොමැත.

විමර්ශන පැවැත්වේනම් ඒවායේ තත්ත්වය ද ගැටලුකාරී ය. මේ වන විට කොමිෂන් සභාවට පැමිණිලි 20,000ක් පමණ ලැබී තිබුණ ද, **කිසිදු විමර්ශනයක් සිදු වෙමින් පවතින බවක් පෙනෙන්නට නැත**. විමර්ශන කණ්ඩායමක් පත් කරන්නැයි ඉල්ලා සිටීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයන් ජනාධිපති රාජපක්ෂ හමු වූ බව මාධ්‍ය වාර්තාවල දැක්විණි.[28] කොමිෂන් සභාවට ලැබී ඇති පැමිණිලි අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට එරෙහි පැමිණිලි නිසා, විධායකය විසින් පත් කරනු ලබන විමර්ශන කණ්ඩායමකට ස්වාධීනව කටයුතු කළ හැකි ද යන ගැටලුව මෙහි දී ඉස්මතු වේ. තව ද, 'විමර්ශන' යන්නෙන් කොමිෂන් සභාව නිශ්චිතව ම අදහස් කළේ කුමක්ද යන්නත් පැහැදිලි නැත. විමර්ශනයක දී අවම වශයෙන්, ශ්‍රී ලංකා රජයේ රැඳවුම් මධ්‍යස්ථානවල තත්ත්වය, යුද සමයේ රෝහල් වාර්තා, අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ කඳවුරුවල ලියාපදිංචි කිරීමේ ලේඛන සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ලියාපදිංචි කිරීමේ ලේඛන ආදිය පරීක්ෂා කිරීමට අවශ්‍ය වේ. කෙසේ වුව ද, අතුරුදහන් වූවන්ගේ පවුල්වල අපේක්ෂාව නම් ඊටත් වඩා ගැඹුරින් කරුණු සොයා බැලීමයි.[29] අතුරුදහන් වූ පුද්ගලයාට කුමක් සිදු වූයේ දැයි නිශ්චිතව ම දැන ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් එක් එක් සිද්ධි වෙන වෙනම විමර්ශනයට ගෙන ඔවුන් අවසන් වරට දුටු ස්ථාන පිළිබඳව වැඩි දුරටත් විමසා බලා, ඔවුන් තවමත් ජීවත්ව සිටින්නේ නම් ඔවුන් සිටින ස්ථාන

---

[27] මුලන්කාවිල්හි පැවති මහජන හමුව, 2014 සැප්තැම්බර් 27

[28] *'Form Team to Probe SL Disappearances'*, ද නිව් ඉන්දියන් එක්ස්ප්‍රස්, 2014 සැප්තැම්බර් 29, මෙතනින් ලබාගන්න: http://www.newindianexpress.com/world/Form-Team-to-Probe-SL-Disappearances/2014/09/29/article2454409.ece

[29] කරුණු ඉදිරිපත් කිරීමට පැමිණි බොහෝ පවුල් මේ වන විටත් සිය ඥාතීන් රැඳවුම් මධ්‍යස්ථානවල සිටින්නේ දැයි සොයා බලා ඇති අතර, අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ කඳවුරුවල ලියාපදිංචි කිරීමේ ලේඛන සහ රෝහල් වාර්තා පවා පරීක්ෂා කර තිබේ. කොමිෂන් සභාව හමුවට පැමිණීමෙන් ඔවුන් අපේක්ෂා කරන්නේ සොයා ගැනීමට නොමැති තොරතුරු හෝ ඔවුන්ට සොයාගත නොහැකි තරම් ඔබ්බෙන් ඇති තොරතුරු අනාවරණය කර ගැනීමයි.

පිළිබඳව තමන්ට පිළිතුරු සැපයිය යුතු බව පවුල්වල ඥාතීන්ගේ අපේක්ෂාවයි. එබැවින්, විමර්ශන කටයුතු සිදු කිරීමේ සැලසුමට කොමිෂන් සභාව විසින් ප්‍රමුඛතාව ලබා දිය යුතු ය. පළමු වටයේ මහජන හමු පවත්වා වසරක තරම් කාලයත් ගත වී තිබිය දීත්, කොමිෂන් සභාව විසින් තවමත් ස්වාධීන විමර්ශන කණ්ඩායමක් හඳුනාගෙන හෝ පැමිණිලි සම්බන්ධයෙන් සැබෑ ලෙස සොයා බැලීම ආරම්භ කර හෝ නොතිබීම තරමක කනස්සල්ලක් ඇති කරයි.

සිවිල් සමාජය, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, විදේශ තානාපති කාර්යාල සහ මාධ්‍යවේදීන් හමුවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව දිගට ම විවෘතව කටයුතු කළ ද, ඔවුන් විසින් ඉස්මතු කරන ලද ගැටලු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවාට පිළියම් යෙදීම සිදුවන්නේ අවම මට්ටමෙනි. එබැවින්, කොමිෂන් සභාවේ සැබෑ වුවමනාව සහ ඉලක්කය කුමක්ද යන්නත් යුක්ති සහගත ප්‍රශ්නයකි. සත්‍යය සොයා යාම තුළ ඇති **සැබෑ දුක්ගැනවිලිවලට පිළියම් යෙදීමට දැනට වඩා පුළුල් සංවාදයක්** වහාම ක්‍රියාවට නැංවිය යුතු කටයුත්තක් සේ සළකා ඇරඹිය යුතු ය - යුද්ධයේ බලපෑමට ලක් වූ ප්‍රජාවන් සමග වසර ගණනාවක් තිස්සේ කටයුතු කර ඇති සිවිල් සමාජයට මේ සම්බන්ධයෙන් සහයෝගය සහ උපදෙස් ලබා දීමට හැකියාව තිබේ.

සත්‍යය සොයා යාම සහ යුක්තිය යුද්ධයේ බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට ඉතා වැදගත් කරුණු වන අතර, කොමිෂන් සභාව විසින් මෙම අවශ්‍යතාව අමතක නොකළ යුතු ය. බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ අවශ්‍යතාවලට පිළියම් ලැබෙන බව තහවුරු කිරීම සහ ශ්‍රී ලංකාවේ දිගු කාලීන සමගි සන්ධාන ක්‍රියාවලියට පහසුකම් සපයන අන්දමින් ගැටලුවලට පිළියම් යෙදීමට අවංක උත්සාහයක් ඇති බව පෙන්වීම සඳහා, මෙම සටහනෙන් ඉස්මතු කර ඇති ගැටලු පිළිබඳව ඉක්මන් පියවර ගන්නා ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කොමිෂන් සභාවෙන් සහ අදාළ ක්‍රියාකාරීන්ගෙන් උදක්ම ඉල්ලා සිටී.